**සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව - 2015**

**-----------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ( SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**------------------------------**

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.60,609,649 ක් වූ ශුද්ධ පාඩුවක් සමාගම විසින් දරා තිබුණි. එබැවින් 2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වගකීම් රු.418,146,224 කින් එහි මුළු වත්කම් ඉක්මවා තිබූ අතර සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු.160,987,462 කින් ඉක්මවා තිබුණි. තවද, සමාගමේ ඇතැම් නිෂ්පාදන සඳහා දළ ලාභ ආන්තිකය සෘණ අගයක පැවති බව මාගේ අවධානයට ලක් විය. ණය ආපසු ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් සමාගමේ දේපල පිළිබඳ නෛතික හිමිකම් සඳහා විවිධ පාර්ශවයන් විසින් හිමිකම් ඉල්ලා තිබූ අතර ඔවුන්ගෙන් කිහිපදෙනෙක් සමාගමට එරෙහිව දැනටමත් නඩු පවරා ඇත. මෙම කරුණු අනුව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පැවතෙන බව පෙනී යන බැවින් සමාගමේ අඛණ්ඩව පැවැත්මේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇතිවන අතර එබැවින්, සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේදී එහි වත්කම් උපලබ්ධි වීම සඳහා හා වගකීම් ඉටුකර ගැනීමට නොහැකි වනු ඇත. කළමනාකරණ සැලසුම් පැවති බව හෝ වෙනත් අවම කිරීමේ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් සහිතව මෙම කරුණ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් (සහ එයට සටහන් වලින්) හෙළිදරව් නොකරයි.

(ආ) සමාගම විවිධ රජයේ ආයතනවලින් ණය, තාවකාලික ණය හා අත්තිකාරම් ලබා ගෙන ඇත. කෙසේ වුවද, එම ණය මුදල්, තාවකාලික ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් වාර හා කොන්දේසි සමාලෝචනය කිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව හා සමුපකාර තොග වෙළඳ සංස්ථාව (CWE) යන ආයතනවලින් ලබා ගන්නා ලද ණය හා අත්තිකාරම් සඳහා අදාළ ණය ගිවිසුම් හෝ වෙනත් ආධාරක ලියකියවිලි මා වෙත ලබා දී නොතිබුණි. එබැවින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.283,283,813 ක් වූ ණය මුදල්, තාවකාලික ණය මුදල් හා අත්තිකාරම් පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමක් පිළිබඳව මට සෑහීමට පත් විය හැකි ලෙස ප්‍රමාණාත්මකව උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. තවද ඉහත ණය ගිවිසුම් හෝ වෙනත් ආධාරක ලියවිලි නොමැතිවීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන රු.1,431,854 ක්වූ මූල්‍ය පිරිවැය පිළිබඳ සම්පූර්ණත්වය සම්බන්ධයෙන් සත්‍යාපනය කිරීමට ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

(ඇ) දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ විස්තරාත්මක උපලේඛන සමාගම විසින් පවත්වා නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට රු.35,478,584 ක්වූ මුළු මුදලකට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර තිබූ දේපල, පිරියත උපකරණ පිළිබඳ තක්සේරුව හා සම්පූර්ණත්වය සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට හෝ විකල්ප අර්ථයෙන් පරීක්ෂා කිරීමට මට නොහැකි විය.

(ඈ) දිගුකාලීන හිඟහිටි ලැබිය යුතු ශේෂ සඳහා සමාගම විසින් හානිකරණයක් (බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන) හෝ ඒවා අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ පැහැදිලි කිරීම් ලබා දී නොතිබුණි. එබැවින්, 2015 දෙසැම්බර් 31 දිනට රු.21,053,227 ක් වූ ලැබිය යුතු වෙළඳ ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් සෑහීමකට පත්වීමට හෝ විකල්ප අර්ථයෙන් පරීක්ෂා කිරීමට මට නොහැකි විය.

(ඉ) සමාගම විසින් 2015 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු රු.3,895,553 ක මුදල්වලට එරෙහිව ලැබීම් (සේවකයන්ට ලබා දුන් අත්තිකාරම්වලින් මූල්‍ය ප්‍රකාශනවල විවිධ ගිණුම නියෝජනය වේ.) නිරවුල් කර නොතිබුණි. එබැවින්, වාර්තාකරණ දිනයට එකී ගිණුම් ශේෂය නිරවුල් නොකළ ලෙස පවතී.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.38,299,070 ක්වූ පැවැත්ම, හිමිකම් හා ප්‍රමාද කල ආදායම් පිළිබඳ වගකීම (වන්දි සඳහා රජයෙන් දෙනු ලබන ප්‍රදාන) සත්‍යාපනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ උචිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.148,966,070 ක් වූ හිඟ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වියදම්, ව්‍යාපාර පිරිවැටුම් බදු වෙළෙඳ ණය ගැතියෝ පෙර වර්ෂවල ගැලපීම්, තොග හා සීමිත සංචිත ගිණුමේ හර ශේෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් උචිත සාක්ෂි මා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) 2015 දෙසැම්බර් 31 දිනට තෙවන පාර්ශව ශේෂ තහවුරු හා පොදු ලෙජරය අතර ණයහිමියන් තිදෙනෙකුගේ හා නොගෙවූ ණය ශේෂවල පිළිවෙලින් රු.12,458,885 ක් හා රු.27,549,830 ක වෙනස්කම් විය.

(එ) 2015 දෙසැම්බර් 31 දිනට රු.546,173 ක්වූ පියවාගත හැකි විලම්භිත බදු වත්කම සම්බන්ධයෙන් ප්‍රමාණවත් උචිත සාක්ෂි මා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.

(ඒ) සම්බන්ධිත පාර්ශව සම්බන්ධතාවයන්, ගනුදෙනු, බැඳීම් ඇතුළත් හිඟ ශේෂයන් හා එම විෂයන් සම්බන්ධයෙන් සමාගම හා එහි සම්බන්ධිත පාර්ශවයන් කළ යුතු හෙළිදරව් කිරීම් තීරණය කිරීම සමාගම විසින් හඳුනාගෙන නොතිබුණි. මෙය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලින් බැහැර වීමක් විය.

(ඔ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවල අවශ්‍ය පරිදි මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පිළිබඳ වර්ගීකරණයන් සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් සමාගම විසින් සිදු කර නොමැති අතර ගෙවිය යුතු ණය සම්බන්ධයෙන් පැහැර හැරීම් හා කඩ කිරීම් කිහිපයක් තවදුරටත් නිරීක්ෂණය විය.

ඉහත කරුණු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ, වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්, විලම්බිත බදු වත්කම්, ණය මුදල් හා තාවකාලික ණය මුදල්, වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්, ගෙවිය යුතු ආදායම් බදු මූල්‍ය පිරිවැය සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හා හෙළිදරව් කිරීම් සහ මූල්‍ය උපකරණ සඳහා සම්බන්ධිත හෙළිදරව් කිරීම් පරීක්ෂා කිරීමට මට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස, 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීම් අවශ්‍ය වේද යන්න මට තීරණය කළ නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය ව්‍යාචනය කිරීම

----------------------

මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

**වෙනත් කරුණු**

----------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වෙනත් වරලත් ගණකාධිකාරි සමාගමක් විසින් සිදු කරන ලද අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2017 පෙබරවාරි 15, ව්‍යාචනය කරන ලද මතයක් ප්‍රකාශ කර තිබුණි.

### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

----------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍ය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

අ. මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. මගේ මතය වනුයේ,

- ඉහත සඳහන් පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා වෙත ඉදිරිපත් නොකරන ලදි. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

**විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

---------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| **අයිතමය** | **වටිනාකම රු.** | **ඉදිරිපත් නොකළ සාක්ෂිය** |
|---|---|---|
| ණය සහ ණය ගැණුම් | 282,783,813 | ණය ගිවිසුම් සහ සනාථ කිරීම් |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු | 34,506,868 | සනාථ කිරීම් |
| සීමිත සංචිත ගිණුම | (16,113,722) | විස්තරාත්මක උපලේඛන |
| බදු ණය හිමියෝ | 663,938 | විස්තරාත්මක උපලේඛන |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම | 8,689,595 | විස්තරාත්මක උපලේඛන |
| බැංකු අයිරාව - ලංකා බැංකුව හයිඩ්පාක් | (19,967,703) | සනාථ කිරීම් |
| බැංකු අයිරාව - ලංකා බැංකුව ආයතනික ශාඛාව | (91,975,654) | සනාථ කිරීම් |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | (i) මු.රෙ. 395 | බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර ඊලග මාසයේ 15 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වුවත් රු.127,451,480 ක්වූ හර ශේෂයක් හා රු.5,404,784 ක බැර ශේෂයක් ඇති සමාගමේ බැංකු ශේෂ 09 කට අදාලව සැසඳීම් විස්තර හා බැංකු ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 1645 | පොදු 267 ආකෘති පත්‍රය ප්‍රකාරව සමාගමේ වාහන ලොග් පොත් නියමිත පරිදි භාවිතා කර නොතිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ 2.10 වගන්තිය | සේවකයින්ගේ පත් කිරීම්, මාරු කිරීම්, උසස්වීම්, වැටුප් වර්ධක ගෙවීම් සහ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ලිපිවල පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) **2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| (i) 4.2.6 ඡේදය | කාර්තුව අවසාන වීමට දින 30 කට පෙර කාර්තු කාර්ය සාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයේ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුවේ. කෙසේ වුවත් එම කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 4.3 ඡේදය | පාලක මණ්ඩල වාර්තා දින 10 ක් ඇතුළත රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 5.1.3 ඡේදය | පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්ම හා වාර්ෂික අයවැය පිටපත් ඊළඟ මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iv) 5.2.5 ඡේදය | පාලක මණ්ඩලය විසින් යාවත්කාලීන කළ සමස්ත අයවැය ඊළඟ වසරේ ආරම්භයට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) 6.5.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන වී දින 60 කට පෙර කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) **භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දින අංක අයි/ඒ/අයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක පිළිබඳ ලේඛනයක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) 2009 අප්‍රේල් 26 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම සේවකයෙකුම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ තම පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වුවත් සංස්ථාව විසින් එසේ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| (ඊ) **2007 අංක 07 දරන සමාගම් පනත** | |
| **(i)** 220 වන වගන්තිය | මෙම වගන්තියෙන් අවශ්‍ය කාර්යය සඳහා සමාගමේ කොටස් හිමිකරුවන්ගේ අති විශේෂ |

මහා සභා රැස්වීමක් (extraordinary general meeting) අධ්‍යක්ෂවරු දැනුවත්වීමේ දින සිට වැඩකරන දින 20 ක් ඇතුළත කැඳවීමට හා එම රැස්වීම කැඳවන දිනයේ සිට වැඩකරන දින 40 ක් ගතවීමට පෙර පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. කෙසේ වුවද, සමාගම විසින් එම අති විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට අසමත් වී තිබුණි.

| | | |
|---|---|---|
| **(ii)** | 150 වන වගන්තිය | පනතේ සඳහන් පරිදි වාර්තාකරණ දිනයෙන් පසු මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සමාගමට නොහැකි වී තිබුණි. |
| **(iii)** | 133 වන වගන්තිය | සමාගමේ වාර්තාකරණ දිනයෙන් මාස 06 ක් ඉක්මවීමට පෙරාතුව හා පෙර වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු මාස 15 ක් ඉක්මවීමට පෙර එක් එක් ලිත් වර්ෂයකට වරක් පැවැත්විය යුතු කොටස් හිමිකරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවිය යුතු වුවද මේ දක්වා වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට සමාගම අපොහොසත් වී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.60,609,648 ක අලාභයක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.20,377,779 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.40,231,869 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා, පිරිවැටුමේ විශාල අඩුවීමත්, පරිපාලන වියදම්වල වැඩිවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

(අ) පෙර වර්ෂයේ වාර ගණන 0.643 ක්වූ සමාගමේ ජංගම අනුපාතයට සාපේක්ෂව 2015 වර්ෂයේ ජංගම අනුපාතය වාර 0.410 දක්වා අඩුවී තිබූ අතර එය හානිකර කාරක ප්‍රාග්ධන තත්ත්වයක ලක්ෂණයක් විය.

(ආ) මුළු හිමිකම් සෘණ අගයක් ගෙන තිබූ හෙයින් හා කිසිදු ණය ප්‍රාග්ධනයක් නොවූ හෙයින් ස්කන්ධයට ණය අනුපාතය ගණනය කිරීම සඳහා අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ඉලක්කයන් හා ඒ පිළිබඳ ප්‍රගති වාර්තා නොමැතිවීම හේතුවෙන් සමාගමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය නිශ්චය කර ගැනීමට නොහැකි විය. තවද, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

සමාගම පරිගණකගත පඩි ලැයිස්තු පිළියෙල කිරීමේ පද්ධතියක් සඳහා ආයෝජනය කර තිබූ නමුත් පඩි ලැයිස්තු කොටසක් පිළියෙල කිරීම අතින් සිදු කෙරෙන හෙයින් පඩි ලැයිස්තු පිළියෙල කිරීම සඳහා දැනට පද්ධතිය ඵලදායී ලෙස යොදා නොගන්නා බව නිරීක්ෂණය විය. තවද, පවත්නා ඉන්වෙන්ට්‍රි පද්ධතියෙන් මාසික තොග වටිනාකම් ලබා ගැනීමට සමාගමට නොහැකි වී ඇති බැවින් ඉන්වෙන්ට්‍රි පද්ධතියේ ඵලදායිතාවය ප්‍රශ්නගත වී තිබුණි.

### 4.3 ප්‍රසම්පාදනයන්

------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන්, වර්ෂයකට වරක් ලියාපදිංචි සැපයුම්කරුවන් කාලීනව යාවත්කාලීන කළ යුතු විය. සමාලෝචිත වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවක් සමාගම වෙත නොතිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා එම අවශ්‍යතාවය ඉටු කර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

### 4.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

අනුමත කාර්ය මණ්ඩලයක් සමාගම විසින් ස්ථාපිත කර නොතිබූ අතර 2014 සිට 2016 වර්ෂය දක්වා සියයට 72 කින් පවතින කාර්ය මණ්ඩලය වැඩි වී තිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදු කිරීමට අසමත් වීම. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | (i) අනුමත ගෙවීම් සීමා සඳහා වගුවක් (Matrix) නොමැති වීම.<br>(ii) ගෙවීම්, ඉන්වොයිසි හා ලැබීම් සඳහා අනුක්‍රමික අංක කිරීමේ ක්‍රමයක් පවත්වා නොතිබීම. |

(iii) බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල නොකිරීම.
(iv) සංස්ථාපිත ගනුදෙනුකරුවන් සඳහා ණය සීමා පවත්වා නොගැනීම.

| | |
|---|---|
| (ඇ) කළමනාකරණ තොරතුරු පද්ධති | පරිගණක භාවිතා කිරීමේ ප්‍රවේශය සඳහා පොදු මුර පදයක් භාවිතා කිරීම. |